# බියගම ප්‍රාදේශීය සභාව.

# ගම්පහ දිස්ත්‍රික්කය

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 30 දින ද ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2013 ජනවාරි 29 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

### 1.2 මතය

සභාපතිවරයා වෙත යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතුකොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති බියගම ප්‍රාදේශීය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී භෞතික තොග ආගනනයක් කර තොග වටිනාකම් ඇතුලත් කළ යුතු වුවත් ගබඩා තොග ලේඛනවල ශේෂය පදනම් කර ගෙන ගණනය කර තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේ ණයහිමියන් යටතේ වෙන්කරන ලද මුදලින් සමාලෝචිත වර්ෂයේ ගෙවීම් කිරීමෙන් පසුව රු.1,666,856 ක අධි වෙන්කිරීමක් විය.

(ඇ) 2011 දෙසැම්බර් 31 දිනට දේශීය ආදායම් කොමසාරිස් වෙත ගෙවිය යුතු වූ රු.5,168,461 ක එකතු කළ අගය මත බදු සඳහා සමාලෝචිත වර්ෂයේ ණය හිමියන් යටතේ වෙන්කිරීම් කර නොතිබුණි.

(ඈ) ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලය හා උප කාර්යාලවල ගොඩනැගිලි ඉදි කිරීම් හා එකතු කිරීම් සඳහා අවස්ථා 10 කදී වැය කර තිබූ රු.1,853,107 ක් ප්‍රාග්ධන වියදම් ඉඩම් හා ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඉ) වඩුවේගම සියඹලාපෙ පිහිටි තෙලඹුගහවත්ත නමැති වෙන්දේසි ඉඩමේ පොදු පහසුකම් සඳහා වෙන්කර පවරාදී තිබුණු වටිනාකම රු.750,000 ක් වූ බිම් කොටස ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකමට එකතු කර නොතිබුණි.

(ඊ) 2011 දෙසැම්බර් 31 දිනට උප කාර්යාල 3 ක රැස්කිරීමේ ගිණුම්වල එකතු වී තිබුණු රු.2,973,157 ක ශේෂය ගිණුම් වලින් අත්හැර තිබුණි.

1.3.2 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.19,869,149 ක්වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

2. **මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.11,461,930 ක්වූ අතර, ඉකුත් වර්ෂයේ ඊට අනුරූපීව ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු. 14,224,819ක විය.

2.2 **මූල්‍ය පාලනය**

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයේ මුදල් පොතේ ඍණ ශේෂය 2,318,849 ක්වූ අතර, වර්ෂ අවසානයේදී ඍණ ශේෂය රු 5,069,542ක් විය. මෙම තත්ත්වය සභාවේ අවධානයට යොමුකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ පෙර ගෙවුම් ශේෂය රු.18,583,420 ක් වූ අතර, ඒ තුළ වසර තුනක් ඉක්මවූ රු.18,390,609 ක පෙර ගෙවුම් ශේෂයක් ඇතුළත් වී තිබුණි. මෙම මුදල් අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණ අතර, 2003 ට පෙර ගෙවන ලද පෙර ගෙවුම් සම්බන්ධයෙන් ගෙවූ දිනය, ගෙවීම් ලාභියාගේ නම් සහ පෙර ගෙවුම් ලේඛනය විගණනයට ඉදිරිපත් නොවීය.

2.3 **ආදායම් පරිපාලනය**

2.3.1 **ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ මූල්‍ය ප්‍රකාශන අනුව ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| | 000 | 000 | 000 |
| (i) වරිපනම් හා බදු | 30,130 | 24,234 | 18,473 |
| (ii) බදු කුලී | 4,571 | 4,450 | 2,784 |
| (iii) බලපත්‍ර ගාස්තු | 3,204 | 2,037 | 4,217 |

| | | | |
|---|---|---|---|
| (iv) වෙනත් ආදායම් | 7,423 | 5,097 | 10,521 |

2.3.2 **මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් නිලධාරින්ගෙන් 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුද්දර ගාස්තුව රු.12,069,715 ක් විය.

2.4 **අවිධිමත් ගනුදෙනු**

ගම්පහ දිස්ත්‍රික් මිල කමිටු මිල ගණන් අනුව 2011 දෙසැම්බර් 31දක්වා ගම්පහ දිස්ත්‍රික්කය තුල පස් කියුබයක් රු.1,600 ක මුදලකට සැපයිය හැකිව තිබියදී පස් කියුබ් 01 ක් සඳහා රු.1,900 බැගින් ගෙවා සමාලෝචිත වර්ෂය තුළදී පස් කියුබ් 588 ක් මිලදී ගැනීම නිසා පස් කියුබ් 01 ට රු.300 බැගින් රු.176,400 ක වැඩිපුර ගෙවීමක් නිරීක්ෂණය විය.

2.5 **කසළ අපහරණ ව්‍යාපෘතිය**

2011 ජූනි මාසයේ සිට අතහැර දමන ලද ගල් වලකට කසළ අපහරණය කිරීම සඳහා ගෙන තිබූ සභා තීරණයක්, අනුව සභාව විසින් කසළ අපහරණ ව්‍යාපෘතියක් ආරම්භ කර රු.19,790,200 ක වාර්ෂික පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර තිබුණි. ව්‍යාපෘතිය ඇරඹීමට පෙර කසළ අපහරණය සඳහා වාර්ෂිකව රු.15,600,000 ක් පමණ වැය කර තිබුණි. කලකදී ගල්වල පිරී යාමෙන් කසළ අපහරණය සඳහා එය දීර්ඝකාලීන විසඳුමක් ලෙසද නිරීක්ෂණය නොවිය.

ඒ පිළිබඳව තවදුරටත් පහත නිරීක්ෂණයන්ද කරනු ලැබේ.

(i) වාර්ෂිකව එකතු වන කැලි කසළ පරිමාව කොතෙක්ද යන්න සමීක්ෂණය කර ගණන් බලා නොතිබීම නිසා ව්‍යාපෘතියේ ආයුකාලය නිශ්චය කරගත නොහැකි වීම.

(ii) ව්‍යාපෘති ඇස්තමේන්තුව සඳහා ඉකුත් වර්ෂ තුනක කසළ බැහැර කිරීම සඳහා දරන ලද වියදම වෙන් වෙන් වශයෙන් දක්වා නොතිබීම

(iii) කසළ බැහැර කිරීම සඳහා පෞද්ගලික අංශයෙන් ට්‍රැක්ටර් 05 ක් හා මිනි ස්කැවේටරයක් කුලී පදනම මත යොදා ගැනීමට සැලසුම්කර වාර්ෂිකව වැය කිරීමට අපේක්ෂා කර තිබුණද එම මුදලින් සභාවට අළුතින් ට්‍රැක්ටර් 03 ක් හෝ 04 ක් හා ස්කැවේටරයක් රු.9,090,000 මිලට ගැනීමට තිබූ හැකියාව පිළිබඳ සළකා බලා නොතිබීම.

(iv) 2011 ජූනි සිට නොවැම්බර් දක්වා පස් කියුබ් 588 ක් කසළ අපහරණය කිරීම සඳහා යොදා ඇති බවට ගෙවීම් කර තිබුණද, ඒවා තහවුරු කිරීමට

මිනුම් වාර්තා ලබා ගෙන නොතිබූ නිසා පස් කියුබ් 588 ක් යෙදූ බව තහවුරු නොවීම.

2.6 **<u>ඩෙංගු මර්ධන ව්‍යාපෘතිය</u>**

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඩෙංගු රෝගය මර්ධනය කිරීමේ කටයුතු සඳහා සේවකයින් 40 ක් බඳවාගෙන තිබූ අතර, ඔවුන්ට දීමනා ලෙස 2010 මැයි සිට නොවැම්බර් දක්වා රු.2,371,200 ක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතිය මාස 02 කින් නිමකිරීමට ඉලක්ක කර තිබූ නමුත් 2011 දෙසැම්බර් දක්වා කාර්යය නිමකර නොතිබුණි.

(ආ) පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතිය නොමැතිව 2010 මැයි, ජූනි, ජූලි රු.1,060,800 ක් හා 2011 ජනවාරි සිට මැයි දක්වා රු. 407,550 ක් දීමනා ගෙවා නොතිබුණි.

(ඇ) එක් එක් මාසය තුළදී සේවකයින් යොදවා තිබූ දින ගණන් ඉක්මවා දීමනා ගෙවා තිබුණි. විස්තර පහත දැක්වේ.

| මාසය | ඩෙංගු ව්‍යාපෘතිය පැවති දින ගණන | දීමනාව ගෙවා තිබූ දින ගණන |
|---|---|---|
| 2010 මැයි | 12 | 25 |
| ජූනි | 07 | 25 |
| අගෝස්තු | 08 | 25 |
| සැප්තැම්බර් | 10 | 25 |
| ඔක්තෝබර් | 09 | 25 |

(ඈ) ව්‍යාපෘතයේ වාර්ෂික ඇස්තමේන්තුගත වියදම රු.830,000 ක්වූ අතර, 2011 මැයි සිට නොවැම්බර් දක්වා වැටුප් සඳහා පමණක් වියදම රු.2,371,200 ක් වී තිබුණි.

3. **<u>පද්ධති හා පාලන</u>**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) අභ්‍යන්තර විගණනය

(ආ) ගිණුම්කරණය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය

(ඉ) තොග පාලනය